**කොළඹ විශ්වවිද්‍යාලය - 2022**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීමෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 1 ත් වර්ෂ 35 ත් අතර කාලයක සිට පවතින ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 34 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.138,919,322 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඉන් අධ්‍යයන නිවාඩු සඳහා විදේශගතව සිටියදී 2022 වර්ෂයේදී සේවය අවසන් කර තිබුණු නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවීමට ඇති මුදල රු.72,294,305 ක් විය. | 2022 වසරේ බැඳුම්කර කඩකර ආචාර්යවරු 13 දෙනෙකුගෙන් රු.51,039,160.67 ක්ද 2022 වසරට පෙර ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 26 දෙනෙකුගෙන් රු.106,015,716.56 ක්ද 31.05.2023 දින විශ්වවිද්‍යාලය පොලිය සමඟ අයකරගෙන ඇත. එමෙන්ම ගිවිසුම් කඩකල ආචාර්යවරයවරුන් පස්දෙනෙකු සම්පූර්ණ බැඳුම්කර මුදල ගෙවා ඇතත් අදාල පොලිය ගෙවීම ප්‍රතික්ෂේප කරන නිසා එය අයකරගැනීමටද කටයුතු යොදා ඇත. එසේම බැඳුම්කර කඩකල ආචාර්යවරු 06 දෙනෙක් සම්බන්ධයෙන් නඩු කටයුතු අරඹා ඇති බව. | කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS) වෙනුවෙන් 2019, 2020 හා 2021 වර්ෂවල දරන ලද විදුලි වියදමෙන් අයවිය යුතු රු.2,237,312 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | රු.1,059,350.85 ක මුදලක් NILIS ආයතනය විසින් 2023 වසරේ කොළඹ විශ්වවිද්‍යාලය වෙත ප්‍රතිපූරණය කර ඇති බව. | මුදල් අයකරගැනීම යාවත්කාලීනව කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේදී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයට විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් ලබා දී තිබුණු රු.5,000,000 ක් වූ ණය මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | මුදල් අයකරගැනීම යාවත්කාලීනව කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා පැරණි එකතුව රු.20,663,677 ක් වූ ගෙවිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. | රු.17,757,289 ක් 2023 වසරේදී ගෙවීමටත් රු. 626,368 ක් ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. පිහිනුම් තටාකයේ කටයුතු ආරම්භ නොවූ බැවින් එම මුදල වෙනත් කටයුත්තක් සඳහා යෙදවීමට ආදී විද්‍යාර්ථයින්ගේ සංගමය සමඟ කටයුතු කරනු ලබන බව. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC & PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයෙන් තොරව 2022 වර්ෂය තුළ ලැබී තිබුණු එකතුව රු.97,310,017 ක් වූ විදේශ ප්‍රදාන විශ්වවිද්‍යාලය වෙත සෘජුව ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | ව්‍යාපෘති 2 ක් 2019 ට පෙර ආරම්භ වී ඇති අතර රු.1,512,000 ක් වූ ඩෙංගු ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රදාන සම්බන්ධයෙන් අනුමැතිය ලබාගෙන නැත. ප්‍රදාන 2 ක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ ජාත්‍යාන්තර අංශය වෙත ලේඛන භාර දී ඇති අතර CONTESSA ව්‍යාපෘතිය විදේශ ආධාර ලැබෙන පර්යේෂණ ව්‍යාපෘතියක් නොව ධාරිතා සංවර්ධන වැඩසටහනක් බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XX වන පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස එකතුව රු.3,280,088,379 ක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. | මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගත යුතු ප්‍රතිපත්තිමය තීරණයක් බැවින් විශ්වවිද්‍යාලයේ පරිපාලනයෙන් බැහැර කටයුත්තක් බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/පුස/1(2016-සංශෝධිත) චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් ඇතුළු ද්‍රව්‍ය සම්බන්ධයෙන් 2017 වර්ෂයෙන් පසු වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. | 2022.01.03 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ 01/2022 ට අනුව 2023 වර්ෂය සඳහා තොග සමීක්ෂණය දැනටමත් සැලසුම් කර ඇති අතර ඒ සඳහා කමිටු සාමාජිකයන් පත්කර ගැනීමට විශ්වවිද්‍යාල පාලනාධිකාරයෙන් ඉල්ලීම් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,330,270,379 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,539,741,375 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.209,470,996 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන අඩුවීම හා වෙනත් පුනරාවර්තන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ සමස්ථ ආදායමෙන් සියයට 25 ක් පමණ රජයේ ප්‍රදානවලින් සමන්විත වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 19 කින් අඩු වී තිබුණි. තවද අභ්‍යන්තර ආදායම් සියයට 92 කින් ද වෙනත් පුනරාවර්තන ප්‍රදාන සියයට 72 කින් ද ඉහළ ගොස් තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් පුනරාවර්තන වියදම් සියයට 54 කින් ඉහළ ගොස් තිබූ අතර ප්‍රග්ධන වත්කම් වැඩිදියුණු කිරීමේ වියදම සියයට 49 කින් පහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.25,230,500,000 ක් වූ ඉඩම් 06 ක් සහ මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම දක්වා නොතිබුණු ඉඩම් 03 ක් පවතින අතර එම ඉඩම් විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද අපොහොසත් වී තිබුණි. | මේ අතරින් ඉඩම් 6 ක් රජය සතු වන අතර ඉඩම් 3 ක හිමිකම සොයාගත නොහැකි බවත් මෙම ඉඩම් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු වෙමින් පවතින බවත් දන්වමි. මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති ඉඩම් 2023 වර්ෂයේ හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලබන බව. | වත්කම් නිවැරදිව හෙළිදරව්කර පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නීත්‍යානුකූල අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ විද්‍යා පීයේ කාර්ය මණ්ඩලය යොදාගෙන Colombo Science and Technology Cell නමින් ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේදී පිහිටුවීමෙන් වසර 5 කට පමණ පසු 2018 අප්‍රේල් 02 දින විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. සමාගම උපයන ආදායමින් විශ්වවිද්‍යාලයට ලබා දිය යුතු දායකත්වය පිළිබඳව අවබෝධතා ගිවිසුමේ සඳහන් කර නොතිබූ අතර පසුගිය වර්ෂ 9 ක කාල | සමාගම පිහිටුවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබාගත් අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා 2015 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලේඛනයක් ඉදිරිපත් කර පසුව | සමාගම පිහිටුවීමට පනත මඟින් ප්‍රතිපාදන සලසා නොමැති විට ඊට අදාල අනුමැතියන් ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| පරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලයට ලබා දී තිබුණු දායකත්වය රු.1,885,690 ක් පමණක් විය. | අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද බව. | |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 හා 2021 වර්ෂවලදී රු.16,930,946 ක් වැයකර සංවර්ධනය කර තිබුණු නීති පීඨයේ ශ්‍රවණාගාරය සඳහා අවශ්‍ය පුටු මිලදී ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ශ්‍රවණාගාරය උපයෝජනය කර නොතිබුණි. | 2022 වර්ෂයට වෙන්කර තිබූ මුදල් නොලැබීම සහ 2022.04.06 දින නිකුත් කරන ලද රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් සියලු රාජ්‍ය වියදම් පාලනය කරන ලෙසත්, වැඩ හා භාණ්ඩ මිලදී ගැනීම නවත්වන ලෙසද දැනුම්දෙන ලද බැවින් ඒ අනුව ඒ සඳහා අනුගත වී ඇත. | කඩිනමින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |